සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 10 - 2023

**10 ශ්‍රේණිය** | **නර්තනය - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි :
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

---

01. විශ්මය නැමැති ස්ථායි භාවයෙන් ජනිත වනුයේ ........................................... රසයයි.
(1) අද්භූත (2) භයානක (3) බීභත්ස්‍ය (4) හාස්‍ය

02. ජන නැටුමක් වන ..................................... නැටුම සිංහල ද්‍රවිඩ හා මුස්ලිම් ජනයා අතර වඩාත් ජනප්‍රිය නැටුමකි.
(1) කොහොඹ කලය (2) ලී කෙළි (3) බුම්මැඩි (4) වේවැල්

03. චාමර නර්තනයේ දී චාමර කවි සමඟ භාවිත කළ හැකි ගායනා විශේෂයක් වනුයේ,
(1) ප්‍රශස්ති (2) මල් යහන් (3) වන්නම් (4) කඩතුරා

04. කැණීම, හෑරීම, ගෑරීම යන ක්‍රියාකාරකම් දැක්වෙන්නේ ................................................. තුළ ය.
(1) තේ කර්මාන්තය (2) කෘෂි කර්මාන්තය (3) පතල් කර්මාන්තය (4) ධීවර කර්මාන්තය

05. ''පැවිය ගනදුරු දුරුර දිවාකර'' මෙම කවි පදයට අයත් සදැස්මත් ගණන වන්නේ ...........................................
(1) 12 කි. (2) 14 කි. (3) 10 කි. (4) 16 කි.

06. කෙනෙකුගේ බාහිර ස්වරූපය වෙනස් කර චරිතයට අවශ්‍ය පරිදි සකස් කර ගැනීම ........................................ අංග රචනයයි.
(1) ස්වභාවික (2) ශෛලිගත (3) විකාරරූපී (4) චරිතාංග

07. සතර බීජාක්ෂර වාදනයේ දී බෙරයේ දකුණු ඇසින් වාදනය වන අක්ෂර වනුයේ ............................................ යන අක්ෂරයි.
(1) තොං, නං (2) තත්, තොං (3) ජිත්, නං (4) තත්, ජිත්

08. මාත්‍රා $2+2+3$ යන තාල රූපය හඳුන්වන්නේ ........................................... යනුවෙනි.
(1) දෙසුළු මහ තුන් තිත (2) දෙසුළු මැදුම් තුන් තිත
(3) සුළු මැදුම් මහ තුන් තිත (4) දෙමැදුම් මහ තුන් තිත

09. ප්‍රස්තාරකරණයේ දී ඇදෙන මාත්‍රා හා නොඇදෙන මාත්‍රා හඳුන්වන්නේ ................................ යනුවෙනි.
(1) ලඝු මාත්‍රා හා ගුරු මාත්‍රා (2) ලඝු මාත්‍රා හා ප්ලුත මාත්‍රා
(3) ගුරු මාත්‍රා හා ද්‍රෘත මාත්‍රා (4) ගුරු මාත්‍රා හා ලඝු මාත්‍රා

10. දෙවන රාජසිංහ රජ සමයේ ලංකාවට පැමිණි දේශ සංචාරක වාර්තාකරුවෙකි,
(1) පාහියන් භික්ෂුව (2) ඉබන් බතූතා (3) ස්පිල් බර්ජන් (4) රොබට් නොක්ස්

11. තුන් තිතේ තාල රූප සඳහා යොදාගන්නා තාල සංකේත වන්නේ,

(1) ∧ / ∧ (2) / / ∧ (3) / ∧ / (4) ∧ ∧ /

12. ''දොදොංත තකුදොං'' යන බෙර පදය වාදනයට අනුව ගැයෙන වන්නම වනුයේ,

(1) සිංහරාජ (2) තුරඟා (3) වෛරොඩි (4) සැවුලා

13. බෝධිසත්ත්ව චරිත ලක්ෂණ හා කාන්තා ලාලිත්‍ය මතු කෙරෙන ගැමි ගායනා විශේෂයක් වන්නේ,

(1) ඔන්චිලිවාරම් (2) කවි (3) රබන් (4) ලී කෙළි

14. නැටුම්, ගැයුම් සඳහා සරස්වතී මණ්ඩපය හා නගර නිර්මාණයේ දී නාට්‍ය ශාලා ඉදිකළ රජතුමා වන්නේ,

(1) පරාක්‍රමබාහු රජතුමා (2) භාතිකාභය රජතුමා

(3) දුටුගැමුණු රජතුමා (4) මහා දැළියාමාන රජතුමා

15. භාතිකාභය රජ සමයේ බෝධි ස්නාන පූජාව සඳහා නැටුම් ගැයුම්වලින් පූජා පැවැත් වූ බව සඳහන් වංශ කතාවක් වන්නේ,

(1) ථූපවංශය (2) චූලවංශය (3) මහාවංශය (4) දීපවංශය

16. තක්කඩ කඩතක ජිජිකුද තා තක ජිජි කුද ..... මෙම කස්තිරම නටනු ලබන්නේ,

(1) 10 වන ගොඩ සරඹයට ය. (2) 9 වන ගොඩ සරඹයට ය.

(3) 11 වන ගොඩ සරඹයට ය. (4) 12 වන ගොඩ සරඹයට ය.

- **අංක 17 - 19 දක්වා ප්‍රශ්නවලට පහත රූපසටහන ඇසුරින් පිළිතුරු සපයන්න.**



A B C D

17. හේවිසි වාදනය සඳහා යොදා ගන්නා භාණ්ඩ ඇතුළත් අක්ෂර වන්නේ,

(1) A, C හා D වේ. (2) B, C හා D වේ. (3) B, A හා C වේ. (4) A, B හා C වේ.

18. පංචතූර්ය භාණ්ඩ වර්ගීකරණයට අනුව ඉහත දැක්වෙන රූප පෙළෙහි B හා D රූප අයත් වන්නේ කුමන වර්ගයට ද?

(1) විතත හා විතතාතත වේ. (2) ආතත හා විතත වේ.

(3) විතත හා සුසිර වේ. (4) විතතාතත හා විතත වේ.

19. උඩරට හා සබරගමු ශාන්තිකර්මවලට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩ වන්නේ,

(1) D සහ A ය. (2) B සහ D ය. (3) A සහ D ය. (4) A සහ B ය.

20. පූජාර්ථය අරමුණු කරගෙන අත් රබාන භාවිත කෙරෙන අවස්ථාවක් වනුයේ,

(1) මංගල උත්සව (2) සූවිසි විවරණ (3) අවුරුදු උත්සව (4) පිරිත් පිංකම්

21. ''ගසමින් කඟපතින් දෙපළුව අසුරසෙන්...'' මෙහි ඊළඟ පද කොටස වන්නේ,

(1) සහගොස් කළ යුදෙන් අසුරන් ජය නොලදින්

(2) දැරූ පා අතළුවෙන් පලු දෙක ගෙන සැනෙකින්

(3) සැවුලා නම එයින් ලොව පල කළ උපතින්

(4) අසුරන් කළ යුදෙන් ජය ගෙන කඳ කුමරුන්

22. ''තකුතක තරිකිට ............................ ගජ්ජිත් ........................ කුංදත් ........................ තරිකිට ........................ දොං තා'' මෙහි හිස් තැන්වලට අයත් පද කොටස් වනුයේ,

(1) තකජිත්, තකුතක, කුංදත්, තරිකිට (2) තකජිත්, තරිකිට, තකුතක, ගජ්ජිත්

(3) තකුතක, කුංදත්, තරිකිට, ගජ්ජිත් (4) කුංදත්, තකජිත්, තකුතක, කුංදත්

23. උඩරට, පහතරට, සබරගමු යන නර්තන සම්ප්‍රදායන්ට අයත් සරඹ පිළිවෙළින්,
(1) ගොඩ සරඹ, දොඹින පද, ඉලංගම් සරඹ (2) ගොඩ සරඹ, ඉලංගම් සරඹ, දොඹින පද
(3) ඉලංගම් සරඹ, අත් සරඹ, දොඹින පද (4) දොඹින පද, ඉලංගම් සරඹ, ගොඩ සරඹ

24. බෙර වාදනයෙන් තොරව නටනු ලබන සරඹ වර්ගයක් වනුයේ,
(1) පා සරඹ හා මණ්ඩි පද (2) පා සරඹ හා ඉලංගම් සරඹ
(3) පා සරඹ හා දොඹින පද (4) පා සරඹ හා ගොඩ සරඹ

25. 8, 9, 10 යන ගොඩ සරඹ වල සරඹ නාම ලෙස ................................................ යන නම් භාවිතා කරයි.
(1) අර්ධ චක්‍ර, පැනීම් සහ දෑත පෑගීම (2) දෑත පෑගීම, අංගහාර සහ බඹර
(3) අංගහාර, අර්ධ චක්‍ර සහ දෑත පෑගීම (4) අර්ධ චක්‍ර, දෑත පෑගීම සහ බඹර

26. උඩරට සම්ප්‍රදායට අයත් දෙවන බෙර සරඹය වනුයේ,
(1) තකට කුදට (2) තක්කඩ කුද කුද (3) ගුහිති ගහිති (4) තකට ජිකට

27. නර්තනය හැදෑරීමේ දී දෑත් හා දෙපා සම්බන්ධ කර ගනිමින් අභ්‍යාස කරනු ලබන සරඹ වන්නේ,
(1) බෙර සරඹ (2) ගොඩ සරඹ (3) පා සරඹ (4) දණ්ඩි සරඹ

28. තෙයිතක /// තෙයි .... යන පා සරඹයේ සරඹ නාමය වනුයේ,
(1) නුහුරු අඩිය (2) කරනම් අඩිය (3) තුන් අඩිය (4) සුරල් අඩිය

- **ප්‍රශ්න අංක 29 - 33 දක්වා දී ඇති ප්‍රශ්නවලට පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.**

| පේළිය | 1 වන තීරුව | 2 වන තීරුව | 3 වන තීරුව | 4 වන තීරුව |
|---|---|---|---|---|
| A | මැදුම් තනි තිත | මහින්ද ඩයස් | ගුරුහාමි | දොං ජිජි ගත |
| B | සෝමබන්දු විද්‍යාපති | පරයා | මුදලි | ටානියා බැරකෝමා |
| C | රොබට් ජූලින්ති | නොංචි | ඩබ්. ඩී. අමරදේව | දොදොංත තකු දොං |
| D | චිත්‍රසේන ඩයස් | මහේෂ් උමගලිය | මහ තනි තිත | අංජලිකා චිත්‍රසේන |

29. සොකරි ගැමි නාටකයේ චරිත සඳහා භාවිත වන තාල රූපය හා බෙර පදය ඇතුළත් වරණය වන්නේ,
(1) A පේළියේ 1 වන තීරුව හා C පේළියේ 4 වන තීරුව.
(2) D පේළියේ 3 වන තීරුව හා A පේළියේ 4 වන තීරුව.
(3) A පේළියේ 1 වන තීරුව හා A පේළියේ 4 වන තීරුව.
(4) D පේළියේ 3 වන තීරුව හා C පේළියේ 4 වන තීරුව.

30. සොකරි නාටකයේ චරිත ඇතුළත් වරණය තෝරන්න.
(1) A පේළියේ 3 වන තීරුව හා B පේළියේ 2 වන තීරුව.
(2) A පේළියේ 3 වන තීරුව හා B පේළියේ 3 වන තීරුව.
(3) B පේළියේ 2 වන තීරුව හා C පේළියේ 2 වන තීරුව.
(4) C පේළියේ 2 වන තීරුව හා A පේළියේ 3 වන තීරුව.

31. කරදිය හා කුම්භ කතාව යන මුද්‍රා නාට්‍යවල රංග රචකයින් ඇතුළත් වරණය වන්නේ,
(1) D පේළියේ 1 වන තීරුව හා D පේළියේ 2 වන තීරුව.
(2) C පේළියේ 1 වන තීරුව හා C පේළියේ 3 වන තීරුව.
(3) B පේළියේ 1 වන තීරුව හා D පේළියේ 2 වන තීරුව.
(4) D පේළියේ 1 වන තීරුව හා D පේළියේ 4 වන තීරුව.

32. කරදිය හා කුඹී කතාව මුද්‍රා නාට්‍යවල රංග වස්ත්‍ර නිර්මාණකරුවන් ඇතුළත් වරණය වන්නේ,

(1) C පේළියේ 2 වන තීරුව හා D පේළියේ 2 වන තීරුව.

(2) B පේළියේ 1 වන තීරුව හා D පේළියේ 2 වන තීරුව.

(3) D පේළියේ 1 වන තීරුව හා D පේළියේ 4 වන තීරුව.

(4) B පේළියේ 1 වන තීරුව හා C පේළියේ 1 වන තීරුව.

33. කුඹී කතාව හා කරදිය මුද්‍රා නාට්‍යවල සංගීතය සැපයූ ශිල්පීන් ඇතුළත් වරණය වන්නේ,

(1) C පේළියේ 1 වන තීරුව හා C පේළියේ 3 වන තීරුව.

(2) D පේළියේ 2 වන තීරුව හා C පේළියේ 3 වන තීරුව.

(3) C පේළියේ 1 වන තීරුව හා A පේළියේ 2 වන තීරුව.

(4) D පේළියේ 2 වන තීරුව හා B පේළියේ 1 වන තීරුව.

34. ''මිනිස් ප්‍රමාණ උස දෙව්වරුන් අභියස පන්සියයක් පමණ හින්දු බාලිකාවන් ගී ගයා නැටූ බව'' සඳහන් කරන දේශසංචාරක වාර්තාකරුවෙකි,

(1) ගම්පොළ යුගයේ පැමිණි ස්පිල් බර්ජන් (2) මහනුවර යුගයේ පැමිණි රොබට් නොක්ස්

(3) ගම්පොළ යුගයේ පැමිණි ඉබන් බතුතා (4) මහනුවර යුගයේ පැමිණි ස්පිල් බර්ජන්

35. ''දොංතකු දොං ජිංතත් ජිංතත් ජිං තරිකිට'' යන අලංකාර බෙර පදයේ තාල රූපය වන්නේ,

(1) මහ තනි තිත (2) සුළු මහ දෙතිත (3) මැදුම් මහ දෙතිත (4) සුළු මැදුම් දෙතිත

36. කොහොඹා කංකාරි පුරාවෘත්තයේ එන චරිත දෙකකි.

(1) මහා සම්මත රජු හා කුවේණිය (2) මහා සම්මත රජු හා මැණික්පාල බිසව

(3) මලය රජු හා සේරමාන් රජු (4) මලය රජු හා කුවේණිය

37. සුළු මහ දෙතිතට වාදනය කළ හැකි බෙර පදයකි.

(1) දොං ජිංත ගත දොංත (2) දොං දොං ජිං ජිං ගජිගත

(3) දො දොංත තකු දොං (4) දෝං ජිං ජිං තකට දොංතක

38. ප්‍රාසාංගික බවින් යුතු අලංකාර මාත්‍රා සහිත නර්තන නිර්මාණයක දී අවධානය යොමු කළ යුතු කරුණක් <u>නොවන්නේ</u>,

(1) තල, දිසා, සම්බන්ධතා නිසිලෙස පවත්වාගෙන යාම.

(2) කැරකීම්, පැනීම්, සුරල් ආදිය සම්මිශ්‍රනය කරමින් මාත්‍රා නිර්මාණය.

(3) සම්ප්‍රදායට නොගැළපෙන පාද චලන හා අංගහාර භාවිතය.

(4) සමබරතාව රැකෙන සේ විවිධ ස්වරූපයේ චලන යොදාගැනීම.

39. උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායන් හි ශාන්ති කර්මවලට අයත් පොදු චාරිත්‍ර වන්නේ,

(1) කප් සිටුවීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම. (2) මිල්ල කැපීම, කප් සිටුවීම, හඟල යැදීම.

(3) මල පේ කිරීම, කප් සිටුවීම, බිසෝකප සිටුවීම. (4) මිල්ල කැපීම, මල පේ කිරීම, හඟල යැදීම.

40. උඩරට, පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්හි හස්ත, පාද හුරුකිරීම සඳහා ප්‍රගුණ කරන සරඹ විශේෂයක් වන්නේ,

(1) පා සරඹ, ගොඩ සරඹ, ඉලංගම් සරඹ නමිනි.

(2) දොඹින පද, ගොඩ සරඹ හා ඉලංගම් සරඹ නමිනි.

(3) ගොඩ සරඹ, ඉලංගම් සරඹ හා දොඹින පද නමිනි.

(4) ඉලංගම් සරඹ, දොඹින පද, ගොඩ සරඹ නමිනි.

(ල. 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

**දෙවන වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2023**
**Second Term Test - Grade 10 - 2023**

| 10 ශ්‍රේණිය | # නර්තනය - II | කාලය පැය 02 යි |
|---|---|---|

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 12 බැගින් හිමි වේ.

---

(01) (i) දුටුගැමුණු රජතුමා නළඟනන් 16000 ක් පිරිවරා රුවන්වැලි සෑය බැඳීමේ උත්සවයට සහභාගී වූ බව ................................................................ සඳහන් වේ.

(ii) සිංහල ජන නැටුමේ එන ලී මල්ලිය දෙමළ ජන නැටුමේ දී ......................................... ලෙස හඳුන්වයි.

(iii) සොකරි නාටකයේ රඟ මඬල ................................................... නමින් හඳුන්වයි.

(iv) උඩරට සම්ප්‍රදායේ 12 වන ගොඩ සරඹයේ සරඹ නාමය ......................................... වේ.

(v) අවුරුදු කාලයේ දී බඳිනු ලබන කතුරු ඔන්චිල්ලා .................................. දෙවියන් ප්‍රධාන කොට ගනිමින් නියමිත නැකතකට අනුව සිදුකරයි.

(vi) සොකරි නාටකය සඳහා ඌව ප්‍රදේශයේ ..................................................................... වාදනය කෙරේ.

(vii) ගම්පල යුගයේ දී ලංකාවට පැමිණි ඉබන් බතූතා නැමැති සංචාරකයා ................................................. නම් ග්‍රන්ථය ලියා ඇත.

(viii) කරදිය මුද්‍රා නාට්‍යයේ සිසීගේ චරිතයට රංගන දායකත්වය ලබා දුන්නේ ............................................. නර්තන ශිල්පිණියයි.

(ix) පහත දැක්වෙන ගීත ඇතුළත් වන්නේ කුමන නාට්‍යයන්හි ද?

(අ) හනික වරෙව් කොල්ලනේ -

(ආ) මෙම ගිම්හාන -

(x) දළදා වහන්සේ වෙනුවෙන් කෙරෙන විශේෂ බෙර වාදන අවස්ථා දෙකකි.

(අ) .................................... (ආ) .................................... (ල. 1 x 12 = 12)

(02) (i) මාත්‍රා 2 + 2 + 4 තුන් තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 04)

(ii) ''සුරිඳුන් පෙර සිටන් බලයුත් සැව තිඳුන්....'' මෙම කවි පදය අදාළ තිත් රූපයට ප්‍රස්තාර කරන්න. (ල. 04)

(iii) සිංහරාජ වන්නමේ අඩව්ව අදාළ තිතට ප්‍රස්තාර කරන්න. (ල. 04)

(03) පහත සඳහන් මාතෘකා අතරින් 3 ක් පිළිබඳව විස්තර කරන්න.

(i) ඔන්චිලිවාරම්   (ii) අංගරචනය

(iii) ගැටබෙරය   (iv) රාජ්‍ය පාලන කටයුතු සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගැනීම.

(v) ඇසළ පෙරහැර (ල. 4 x 3 = 12)

(04) උඩරට, පහතරට, සබරගමු වශයෙන් දේශීය ප්‍රධාන ශාන්තිකර්ම තුනකි.

(i) පහන්මඩුව ශාන්තිකර්මයේ අතීත හා වර්තමාන අරමුණු දෙකක් විස්තර කරන්න. (ල. 04)

(ii) කොහොඹා කංකාරි ශාන්තිකර්මයේ පුද ලබන දෙවිවරු දෙදෙනෙක් නම්කර චාරිත්‍ර විධි දෙකක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

(iii) ශාන්තිකර්ම තුළින් ගොඩනැගෙන සමාජ සාරධර්ම පිළිබඳ විමසුමක් කරන්න. (ල. 04)

(05) (i) නර්තන කලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර 4 ක් නම් කරන්න. (ල. 04)

(ii) නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලද ආකාරය වංශකතා ඇසුරින් සාධක 2 ක් විස්තර කරන්න. (ල. 04)

(iii) ආගමික අවස්ථා සඳහා නර්තනය භාවිත කළ ආකාරය දේශාටන වාර්තා දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 04)

(06)

A



B



C



D



(i) A හා D රූපවල දැක්වෙන භාරතීය නර්තන සම්ප්‍රදාය හා ඒවායේ ප්‍රධාන අවනද්ධ භාණ්ඩ එක බැගින් නම් කරන්න. (ල. 04)

(ii) B හා C රූපවල දැක්වෙන නාට්‍ය දෙක නම් කර B රූපයේ දැක්වෙන නාට්‍යයෙහි ඇති පසුතල දර්ශන ලියා දක්වන්න. (ල. 04)

(iii) C රූපයෙන් දැක්වෙන කතා තේමාවෙන් සමාජයට ලබා දෙන පණිවිඩය විමසුමට ලක් කරන්න. (ල. 04)

(07) (i) ස්වස්ථතාව යන්න කෙටියෙන් හඳුන්වා ඒ කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න. (ල. 04)

(ii) පුද්ගල මානසික සුවතාව පවත්වා ගත හැකි සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් 4 ක් ලියන්න. (ල. 04)

(iii) ''නර්තන ක්‍රියාකාරකම් තුළින් වර්ධනය වන හැකියා හා කුසලතා සාර්ථක දිවි පෙවෙතක් ගත කිරීමට ඉවහල් වේ.'' විමසීමක් කරන්න. (ල. 04)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2023

## 10 ශ්‍රේණිය　　නර්තනය - ප්‍රායෝගික පරීක්ෂණය

සැලකිය යුතුයි :
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

| ප්‍රශ්න අංකය | ක්‍රියාකාරකම | |
|---|---|---|
| (01) | ක්‍රියාකාරකම - ගායනය හා වාදනය | |
| | (i) කැමති ගායනය | 05 |
| | (ii) රබන් කවියක් / චාමර කවියක් | 05 |
| | (iii) කැමති බෙර සරඹයක් වාදනය | 05 |
| | (iv) කැමති බෙර පදයක් වාදනය | 05 |
| | මුළු ලකුණු | 20 |
| (02) | ක්‍රියාකාරකම - සරඹ නර්තනය | |
| | (i) 7 සිට 12 දක්වා නම් කරන ලද ගොඩ සරඹයක් නැටීම. | 10 |
| | (ii) කස්තිරම නැටීම | 10 |
| | මුළු ලකුණු | 20 |
| (03) | ක්‍රියාකාරකම - වන්නම් නර්තන | |
| | (i) සිංහරාජ වන්නම / සැවුලා වන්නම මාත්‍රා 2 ක් නර්තනය | 10 |
| | (ii) කස්තිරම / සීරුමාරුව / අඩව්ව නර්තනය | 10 |
| | මුළු ලකුණු | 20 |
| (04) | ක්‍රියාකාරකම - ගැමි නැටුම් නර්තනය හා නාට්‍ය ගීත අනුව නර්තනය | |
| | (i) චාමර නැටුම / රබන් නැටුම | 10 |
| | (ii) කැමති නාට්‍ය ගීතයකට නර්තනය කිරීම. | 10 |
| | මුළු ලකුණු | 20 |
| (05) | ක්‍රියාකාරකම - නිර්මාණ කුසලතා | |
| | (i) දඩයක්කරුවෙක් කැලයේ දී කුළු මීමෙකු සමග පොර බැද ජීවිතය ගලවා ගැනීම.... (චරිතය - දඩයක්කරු) | |
| | (ii) මහලු යාචක කාන්තාවකට කසල බඳුනක තිබී මුදල් පසුම්බියක් ලැබීම..... (චරිතය - මහලු යාචක කාන්තාව) | |
| | (iii) රජ කුමරෙකු දඩයමේ යයි. එල්ල කළ හී පහර වැරදී යයි. ඉදිරියට පැමිණෙන දිවියා හා සටන් කරයි........ (චරිතය - රජ කුමාරයා) | |
| | (iv) කුසගින්නේ පෙළෙන සිංහයෙකු කෑම සොයා ගමන් කර ගොදුරක් සොයාගැනීම. (චරිතය - කුසගින්නේ පෙළෙන සිංහයා) | |
| | මුළු ලකුණු | 20 |
| | මුළු ලකුණු | 100 |

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (1) | 02. (2) | 03. (1) | 04. (3) | 05. (4) | 06. (4) | 07. (3) | 08. (2) | 09. (4) | 10. (4) |
| 11. (4) | 12. (1) | 13. (3) | 14. (1) | 15. (3) | 16. (1) | 17. (2) | 18. (1) | 19. (3) | 20. (2) |
| 21. (2) | 22. (4) | 23. (2) | 24. (1) | 25. (4) | 26. (1) | 27. (2) | 28. (4) | 29. (3) | 30. (1) |
| 31. (4) | 32. (2) | 33. (1) | 34. (3) | 35. (4) | 36. (4) | 37. (2) | 38. (3) | 39. (1) | 40. (3) |

**II කොටස** (නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින් ලකුණු 40 යි.)

(01) (i) මහා වංශයේ (ii) පින්නල් කෝලාට්ටම්
(iii) කමත (iv) චන්ද්‍රිකා සරඹය
(v) පත්තිනි (vi) දවුල
(vii) විදේශීයන් දුටු පුරාණ ලංකාව (vii) වජිරා චිත්‍රසේන
(ix) (අ) බෙර හඬ (ආ) විදුර
(x) (අ) අඹරා හේවිසි (ආ) ගෙවැදුම් හේවිසි

(02) (i)

| ^ | | ^ | | / | | | | ^ | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| කු | ද | ග | ත | ග | ත | දොමි | - | කු | ද | ග | ත | ග | ත | දොමි | - |

විභාග කර දැක්වීම හා තාල සංඥා (ල. 02)
නිවැරදි ප්‍රස්තාර කිරීම (ල. 02)

(ii)

| ^ | | / | | | | ^ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| සු | රි | ඳුන් | - | පෙ | ර | සි | - | ටන් | - | - | - |
| බ | ල | යුත් | - | සැ | ව | ති | - | දුන් | - | - | - |

විභාග කර දැක්වීම හා තාල සංඥා (ල. 02)
නිවැරදි ප්‍රස්තාර කිරීම (ල. 02)

(iii)

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| තා | - | මි | දො | මි | ති | ග | ත | දො | මි | කි | ට | කඩ | තක | තරි | කිට |
| කි | ත | ක | දො | මි | ති | ග | ත | කිත් | - | තත් | - | කු | ද | කු | ද |
| තා | - | කු | ජිත් | - | ත | ග | ත | දො | මි | කි | ට | තරි | කිට | කුං | දත් |
| තා | | | | | | | | | | | | | | | |

විභාග කර දැක්වීම හා තාල සංඥා (ල. 02)
නිවැරදි ප්‍රස්තාර කිරීම (ල. 02)

(03) (i) ඔන්චිලි වාරම්
* අවුරුදු කාලයේ දී කරන ලද ජන ක්‍රීඩාවක් බව.
* කතුරු ඔන්චිල්ලා, කැරකෙන ඔන්චිල්ලා...... ආදී වශයෙන් ඔන්චිලි වර්ග ඇති බව.
* දරාගැනීමේ හැකියාව, අභියෝගවලට මුහුණ දීමේ හැකියාව ඇති බව.
* ත්‍රිවිධ රත්නයට හා පත්තිනි දෙවියන් ප්‍රධාන කොට නැකතට අනුව ඔන්චිලි පැදීම ආරම්භ කරන බව.
* ගැහැනු, පිරිමි භේදයකින් තොරව ඔන්චිලි පැදීම සිදුකරන බව.
* අනාසාතාත්මක හා ආසාතාත්මකව මෙම කවි ගායනා කරන බව.
* බුදුගුණ, තුන්සරණේ කවි, පින්දීමේ කවි ආදිය ඇතුළත් වන බව.
* කවියක් උදාහරණයට දක්වා ඇත්නම්.

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

(ii) අංග රචනය
* අංග රචනය පිළිබඳ හඳුන්වා දී තිබේනම්
* අංග රචනයේ කොටස් 4 නම් කර විස්තර කර ඇත්නම්
* අංග රචනය සඳහා යොදාගන්නා ද්‍රව්‍ය කීපයක් සඳහන් කර ඇත්නම්
* අංග රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දක්වා ඇත්නම්
(උදා - මුහුණේ ස්වභාවය, ස්ත්‍රී පුරුෂ බව, චරිත ස්වභාවය)
* අංග රචනය භාවිත කරන අවස්ථා දක්වා ඇත්නම්

(iii) ගැටබෙරය
* දේශීය වාද්‍ය භාණ්ඩයක් බව.
* පංචතූර්ය වාදනයේ දී ආතත ගනයට අයත් බව.
* උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩයක් බව
* යොදාගන්නා හම් වර්ග, ලී වර්ග දක්වා ඇත්නම්
* වාදන අවස්ථා නම් කර තිබේනම්
* මඟුල් බෙරය, උඩරට බෙරය..... ආදී වශයෙන් හඳුන්වන බව.
* රූප සටහන ඇඳ කොටස් නම්කර ඇත්නම්

(iv) රාජ්‍ය පාලන කටයුතු සඳහා වාද්‍ය භාණ්ඩ යොදාගැනීම.
* අණබෙර, රණබෙර, වද බෙර, මළ බෙර..... ආදී වශයෙන් නම් කර ඒවා විස්තර කර ඇත්නම්

(v)
* සෞන්දර්යාත්මක වටිනාකම්වලින් යුතු සංස්කෘතික අංගවලින් සමන්විත වන බව.
* කුඹල්, රන්දෝලි පෙරහැර වශයෙන් වීදි සංචාරය කරන බව.
* සතර දේවාල පෙරහැර හා සම්බන්ධ වන බව.
* පෙරහැර අලංකාර කර ගැනීම සඳහා යොදාගන්නා මෙවලම්, අලි ඇතුන්, පොල් පන්දම්, සැරසිලි ඇතුළු විවිධාංග නිසා චමත්කාරය වැඩිවන බව.
* නරඹන්නන්ගේ රසවිඳීම සඳහා නර්තන, වාදන ශිල්පීන් සුවිශේෂ අවස්ථා ඉදිරිපත් කරන බව.
* කප් සිටුවීමේ සිට දිය කැපීම දක්වා චාරිත්‍ර සිදුකරන බව. (ල. $4 \times 3 = 12$)

(04) (i) අතීත - සේරමාන (සේරමන්) රජුට වැළඳුණු හිසරදය සුවකිරීම පිණිස පැවැත් වූ බව.
වර්තමාන -
* සශ්‍රීකත්වය හා බව භෝග සම්පත් ආරක්ෂා කර ගැනීම.
* ගමට, රටට සෙත්පතා
* සංරක්ෂණ කටයුතු සඳහා පවත්වන බව.
* සිසු දරුවන්ගේ හා විද්‍යාර්ථීන්ගේ අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීමට පවත්වන බව. (ල. 04)

(ii)
* කොහොඹා දෙවි තුන්කට්ටුව, බණ්ඩාර දෙවි සත්කට්ටුව, මෙලෙයි යකුන්, රුප්පා යකුන් ආදී වශයෙන් නම්කර ඇත්නම් (ල. 02)
* කප් සිටුවීම, මඩු පේ කිරීම, අයිලෙ යැදීම, තොට පේ කිරීම ආදී වශයෙන් දක්වා කෙටියෙන් විස්තර කර ඇත්නම් (ල. 02)

(iii)
* ත්‍රිවිධ රත්නය සරණ යාම, පංචශීලයේ පිහිටුවීම ආදී ආගමික වත් පිළිවෙත්වලට මුල් තැනක් ලබාදෙන බව.
* ආගන්තුක සත්කාරය
* නායකත්වයට ගරු කිරීම.
* ශිල්පීන් අතර ආචාර සමාචාර සිදුකිරීම.
* පන්ති භේද, කුල භේද තුරන් වී සමාජ සහජීවනයක් ඇතිවීම..... ආදිය දක්වා ඇත්නම් (ල. 04)

(05) (i) වංශ කතා, රූකම්, සාහිත්‍ය කෘති, දේශාටන වාර්තා, සෙල්ලිපි.... ආදී වශයෙන් 4 ක් දක්වා ඇත්නම් (ල. 04)

(ii) වංශ කතා ඇසුරින් සාධක දෙකක් විස්තර කර ඇත්නම් (ල. 04)

(iii) ඉබන් බතූතා, ස්පිල් බර්ජන්, රොබට් නොක්ස් යන දේශාටන වාර්තා ඇසුරින් දෙකක් විස්තර කර ඇත්නම් (ල. 04)

## පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස

(06) (i) A - භරත D - කතක් (ල. 02)
A - මෘදංගය D - තබ්ලාව (ල. 02)
(ii) B - කරදිය මුද්‍රා නාට්‍ය C - කුම් කතාව මුද්‍රා නාට්‍ය (ල. 02)
පසුතල දර්ශන
ධීවර ගැමි ජනතාවගේ ස්වභාවයත් එම පරිසරයත් මවාපාන ගල්පර, පැල්පත, මුහුදු රළ, වැටකෙයියා පඳුර, මකුළුවාගේ දැල වැනි පසුතල දර්ශන දක්වා ඇත්නම් (ල. 02)
(iii) එකමුතුකම / සමඟිය / අභියෝගවලට මුහුණ දීම / පරෝපකාරය / සතුරාට පවා හතුරුකම් නොකිරීම / උත්සාහයෙන් නැගී සිටීම... ආදිය දක්වා ඇත්නම් (ල. 04)

(07) (i) යම් පුද්ගලයෙකු තුළ සිතෙහි ඇතිවන සුවතාවය හෙවත් මානසික සුවය.... ආදී වශයෙන් හඳුන්වා ඇත්නම් (ල. 02)
කායික සාධක / මානසික සාධක (ල. 02)
(ii)
* නිර්මාණාත්මක ක්‍රියාකාරකම් සඳහා ඉදිරිපත් වීම.
* කලා කෘති ඇගයීමට ලක් කිරීම.
* ප්‍රාසාංගික කලා අංගයන් පිළිබඳව නිවැරදි ඇගයීම.
* ඉගෙනුම් ක්‍රියාවලිය තුළ සක්‍රීය දායකත්වය. (ල. 04)

(iii)
* බෙදාහදා ගැනිම හා සහයෝගය
* නීතිරීති පිළිපැදීම.
* නායකත්වයට ගරුකිරීම.
* ජය පරාජය සම සිතින් පිළිගැනීම.
* ඉවසීම හා කැපවීම.
* කඩිසර බව හා තර්කානුකුල චින්තනය
* නිර්මාණශීලී චින්තනය
* ශාරීරික චලන පාලනය (ල. 04)